# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 10 දරන ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.50 යි.　　　　තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 10 දරන ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 30 වන දින.]

එල්. ඩී.–ඕ. 27/96.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 10 දරන ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ දීර්ඝ නාමයේ යෙදෙන "ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉ) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් සහ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අනුබද්ධ ආයතන යම් ගණනක්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියට ඉහතින්ම වූ IV වන කොටසේ ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ iv වන කොටසේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

"ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ශිල්පායතනයක් හෝ ශිල්පායතන ගණනක් පිහිටුවනු ලැබිය හැකි ය :—" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් සහ අනුබද්ධ ආයතන යම් ගණනක් පිහිටුවනු ලැබිය හැකි ය :—" යන වචන ආදේශ කිරීමෙන් ;

2—D 046813—5,900 (97/10)

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "එම ශිල්පායතනවල" යන වචන වෙනුවට "එම ආයතනවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "එම ශිල්පායතන" යන වචන වෙනුවට "එම ආයතන" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ "ශිල්පායතන" යන වචනය හෝ එහි ව්‍යාකරණානුකූල ප්‍රභේදය යෙදෙන කවර හෝ තැනක "ආයතන" යන වචනය ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ක්‍රීඩා ශිල්පායතනවලට" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ආදියට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ "ඒ ශිල්පායතන" යන වචන හෝ එහි ව්‍යාකරණානුකූල ප්‍රභේදය යෙදෙන කවර හෝ තැනක "ඒ ආයතන" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ක්‍රීඩා ශිල්පායතනවල" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය යනාදියෙහි" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.